**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම - 2015**

-----------------------------------------------------------------------

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂයේ දී සමාගම රු.මිලියන 450 ක ශුද්ධ අලාභයක් උපයා තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට එහි සමුච්චිත අලාභය රු.මිලියන 1,426 ක් දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම 2007 අංක 07 දරන සමාගම් පනතේ 220(1) වගන්තිය ප්‍රකාර සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම බැරකම් ප්‍රමාණය රු.මිලියන 1,372 ක් වූයෙන් දැඩි ප්‍රාග්ධන හිඟයකට ද මුහුණ දී තිබුණි. එහෙයින් සමාගමේ, අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැන නැගී තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයවීම අවිනිශ්චිත තත්ත්වයක පවතින රු.මිලියන 28.4 ක ලැබිය යුතු ටග් යාත්‍රා වන්දි (Tug Claim Receivables) ශේෂය තෙවන පාර්ශව වෙතින් ශේෂ සනාථ කිරීම් මගින් තහවුරු වී නොතිබුණි. එහෙයින්, අනාගතයේ සිදුවිය හැකි හානිකරණ පාඩු (Impairment Loss) සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

නැව් තෙල් තොග වලට අදාලව පොත් වල දැක්වෙන තොග ශේෂය සහ භෞතික ශේෂය අතර ඇ.ඩො 2,092,400 ක පැහැදිලි නොකල වෙනස්කම් දක්නට ලැබුණි.

| තෙල් තොග වර්ගය | පොත් අනුව ශේෂය මෙ. ටොන් | භෞතික තොගය අනුව ශේෂය මෙ. ටොන් | වෙනස මෙ. ටොන් | සාමාන්‍ය ගැනුම් පිරිවැය ටොන් එකක මිළ ඇ.ඩො. | වටිනාකම ඇ.ඩො. |
|---|---|---|---|---|---|
| දැවිතෙල් (IFO 380) | 663 | 1,853 | 1,190 | 580 | 690,200 |
| නාවික ගෑස් තෙල් (MGO) | 14,582 | 16,140 | 1,558 | 900 | 1,402,200 |
| | | | | | 2,092,400 |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව</u> | <u>අනුකූල නොවීම්</u> |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඞී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 4.2.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම කාර්යසාධන ඇගයීම් කටයුතු සිදුකර කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇගයීම් සඳහා ඉදිරිපත් කළයුතු වුවත් සමාගම එවැනි ඇගයීමක් සිදුකර නොතිබුණ අතර කාර්යසාධන වාර්තාවක් ද පිළියෙල කර නොතිබුණි. |
| (ii) 5.1.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කළයුතු වුවත් සමාගම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 5.1.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම ක්‍රියාකාරි සැලැස්මක් (Action Plan) පිළියෙල කර ඊට අනුගත වැඩ විස්තරයක් ඉදිරිපත් කළයුතු වුවත් සමාගම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (iv) 7.2 වගන්තිය | ආයතනයේ පාලන පරිසරයේ ප්‍රධාන අංගයක් ලෙස සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සකස් කරන ලද මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System) පිළියෙල කළ යුතු වුවත් සමාගම එවැනි මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. |
| (v) 7.4.1 වගන්තිය | විගණන කමිටුව රැස් වී අභ්‍යන්තර විගණනයෙන් සොයාගත් කරුණු මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට අදාල නිර්දේශ ලබාදිය යුතු වුවත්, සමාගමේ අභ්‍යන්තර විගණන අංශයක් නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් පැවැත්වීමක් ද සිදුව නොතිබුණි. |
| (vi) 8.2.2 වගන්තිය | අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු වුවත් සමාගම 2015 වර්ෂයේ දී කරන ලද රු.මිලියන 251ක් වූ ආයෝජන සඳහා එම එකඟතාවය ලබා ගෙන නොතිබුණි. |
| (vii) 9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින් සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) සකසා ඊට රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවත්, සමාගම පවත්නා තනතුරු සඳහා එවැනි බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඊට අදාල |

පාර්ශවයන්ගේ අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය

එකතුකළ අගය මත බදු ගෙවීම පිළිබඳ මාසික වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ මාසික වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

---------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 449 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.මිලියන 983 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.මිලියන 534 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම රු.මිලියන 501 කින් අඩුවීම අලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.7,991,434 ක්ව පැවති ශුද්ධ ලාභය 2015 වර්ෂය අවසානයට රු.449,754,034 ක ශුද්ධ අලාභයක් දක්වා පිරිහී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය, හානිකර අලාභ හා විදේශ විනිමය අලාභ සැලකිල්ලට ගැනීමේදී 2013 වර්ෂයේ රු.22,566,878 ක්ව පැවති ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂය අවසන් වනවිට රු.215,179,149 ක් වී තිබුණි.

4. **විග්‍රහාත්මක සමාලෝචනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සමාගමේ ජංගම අනුපාතය 6.8 ක් වු අතර 2015 වර්ෂයේ දී එය 0.52 ක් වූයෙන් එහි දැඩි පිරිහීමක් දක්නට ලැබුණි. කෙසේ නමුදු මෙම වාර්තාවේ 2.2.1 ඡේදය ප්‍රකාර ඉදිරියේ දී සමාගමට කාරක ප්‍රාග්ධන ගැටළු මතුවිය හැකි දැඩි අවධානමක් නොපවතීය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) 2013 වර්ෂයේ දී ශුද්ධ ලාභ අනුපාතය සියයට 27 ක් වූ අතර එය 2015 වර්ෂයේ දී සියයට ඍණ 29 ක් දක්වා පිරිහී තිබුණු අතර ඒ අනුව සමාගමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපවතීය යන්න විගණනයේදී බැහැර කල නොහැකි විය.

5. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

5.1 **කාර්යසාධනය**

-------------------

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය (Articles of Association) ප්‍රකාර පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාගම පිහිටුවා තිබුණි.

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමාගම වෙත කලින් කලට පවරනු ලබන රාජකාරි හා කාර්යයන් ඉටු කිරීමත්, මාගම්පුර වරාය කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

(ආ) නවීන ජාත්‍යන්තර මුහුදු වරායක් ලෙස හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධනය කිරීම.

(ඇ) හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය සීමාව තුල කාර්මික කලාපයක් ඇති කිරීම.

(ඈ) නාවික යාත්‍රා වලට නැව් තෙල්, ජලය සහ අනිකුත් සේවා සැපයීම.

කෙසේ වුවද හම්බන්තොට වරාය සීමාව තුල කාර්මික කලාපයක් ඇති කිරීම එක් ප්‍රධාන අරමුණක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අරමුණ ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 5.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ඉහත අරමුණුවලට අයත් නොවන කාර්යයක් වූ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ( Interlock Blocking ) සහ ගල් කඩන යන්ත්‍ර (Crusher) මෙහෙයුම් කටයුතු සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි. ඒ අනුව එම ක්‍රියාකාරකම් හේතුවෙන් 2014 වර්ෂයේදී රු.5,375,253 ක දළ අලාභයක් හා 2015 වර්ෂයේදී රු.4,149,757 ක දළ ලාභයක් ලබා තිබුණි. මේ අනුව ඉහත ක්‍රියාකාරකම්වලින් රු.1,225,496 ක ශුද්ධ දළ අලාභයක් සිදු වී තිබුණි.

(ආ) <u>නැව් තෙල් තොගය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද අනුමැතියකින් තොරව 2015 අප්‍රේල් මාසයෙන් පසුව නැව් තෙල් තොග මෙහෙයුම් කටයුතු මුළුමනින්ම නවතා තිබීම හේතුවෙන් පිරිවැය රු.1,841,036,066 ක් වූ තෙල් තොගයක් නිෂ්කාර්යව ගබඩා කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිගේ 2016 ජුනි 24 දිනැති ලිපිය අනුව භාවිතා කල නොහැකි තත්ත්වයක තිබුණු පිරිවැය රු.161,356,712 ක් වූ අයි.එෆ්.ඕ (IFO) වර්ගයේ නැව් තෙල් මෙට්‍රික් ටොන් 1964.2 ක තෙල් තොගයක් සඳහා රු.75,340,526 ක රක්ෂණ වන්දි ලැබී තිබුණි. කෙසේ නමුත් ගබඩාවේ ඉතිරිව පවතින එම්.ජී.ඕ (MGO) වර්ගයේ පිරිවැය ඇ.ඩො.මිලියන 13.7 ක් වූ නැව් තෙල් මෙට්‍රික් ටොන් 14,583 ක ප්‍රමාණයෙහි ද දැනටමත් වර්ණය වෙනස් වී ඇති බැවින් එම තෙල් තොගය ද ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සේවක මණ්ඩල කළමනාකරණය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | ණයගැති පාලනය | දීර්ඝ කාලීනව අයකර නොගත් ශේෂ පැවතීම. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් නොපිහිටුවීම සහ විගණන වැඩසටහනක් අනුව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |
| (ඈ) | තොග පාලනය | භාවිතයට ගත නොහැකි තොග හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු නොකිරීම. |